# ආසනික් විසට ගොදුරුවුණු අතපය





## Hands and feet affected by Arsenic

Arsenic can kill humans quickly if consumed in large amounts, although small, long-term exposure can lead to a much slower death or other illness. Studies have linked prolonged exposure to arsenic with cancer, diabetes, and thickening of the skin, liver disease and problems with the digestive system. It has also been associated with nervous system disorders - feeling tingling or losing sensation in the limbs - and hearing difficulties.

Acute arsenic poisoning causes a metallic taste in the mouth, excessive saliva production and problems swallowing. The next stage is to suffer vomiting and diarrhoea coupled with garlic-like breath, stomach cramps and excessive sweating.

As the poison's effects progress, the patient will suffer seizures and go into shock, dying within a few hours. If death does not occur at this stage, it will happen a few days when the kidney fails.


Forty million people in West Bengal and Bangladesh are thought to be at risk from arsenic-contaminated water supplies.The contamination is thought to have occurred naturally, as a result of arsenic being released from rocks into underground water supplies. **(BBC World Service)**

ආසනික් නම් උග්‍ර වස වර්ගය විශාල ප්‍රමාණයක් ශරීරගත වුවහොත් ක්ෂණිකව කෙනෙකුගේ මරණය සිදුවන අතර කුඩා ප්‍රමාණයක් වුවද මරණය සෙමින් සිදුවීමට හා එසේ නොවුවහොත් නොයෙක් ලෙඩ රෝග වලට ද හේතුවන්නේය. දිගු කාලයක් පුරා ආසනික් ශරීර ගතවීමෙන් පිළිකා ඇතිවීම, අක්මාවේ, වකුගඩුවේ බිඳවැටීම, ආහාර පද්ධතියේ, උගුරේ ආබාධ සහ හමේ රෝග ඇතිවීමට ද වමනේ යෑම හා බඩයෑමද සිදු වෙනවා ඇත.

බටහිර බෙංගාලයේ හා බංගලාදේශයේ මිලියන 40 ක ජනකායක් ආසනික් විසවීමට ගොදුරුව ඇත. ඒ ඔවුන් පාවිච්චි කරන වතුර නිසාය. ස්වාභාවිකව ගල් පර්වත ආදියෙහි සැදුණු ආසනික් විෂ සේදී අවුත් භූගත වතුර හා මිශ්‍රවීමෙන් එසේ වන්නට ඇත යනු ප්‍රකාශයට පත්ව ඇති එක් මතයකි.

## ඇත්ත කෙටි කතාව

# ඔමානයට වීසා නැතුව!



මතක හැටියට ඒ 1991 වසරයි. ඩුබායි හරහා ශ්‍රීලංකාවට ගිය අපි නැවත ලන්ඩනයට ඒමේ දී තුන් දිනක් ඩුබායි නගරයේ රැඳී සිටීමට තීරණය කළෙමු. ශ්‍රීලංකා ගමන අවසන ඩුබායි නගරයට පැමිණි අපි එහි හෝටලයක නවාතැන් ගතිමු. එම හෝටලයේ උප කළමනාකරු වූයේ ශ්‍රී ලාංකික මුස්ලිම් මහතෙකි. ඔහු අපට ඉතා හොඳින් සැලකූ අතර, දින තුන ඇතුළත හැකිතරම් වටපිටාව නැරඹීම අපගේ ඒකායන අභිප්‍රාය විය.

දෙවන දින උදේ මම මැනේජර්වරයා අමතා ඩුබායි සිට යාහැකි වෙනත් රටවල් වල මායිම් කව රේදැයි විමසුවෙමි. ඕමාන් රටේ මායිම් පැය දෙකක වාහන ගමනකින් යා හැකි බවත්, එය දිනක චාරිකාවක් ලෙස කළ හැකි බවත් ඔහු පැවසීය. බංගලාදේශ් ජාතිකයෙකු එළවූ කුලීරියක් අපට කතාකර දුන් ඔහු අපව පරිස්සමින් ගෙනගොස් ගෙන එන්නැයි රියැදුරුට අවවාදයක් ද දුන්නේය. මාත් බිරිඳත් දියණියන් දෙදෙනාත් ගමන පිටත් වූයෙමු.

කාන්තාරය මැදින් ගමන් ගත් රථය ක්‍රම ක්‍රමයෙන් ගස්කොලන් යාන්තමින් වැවීගෙන එන ප්‍රදේශයකට සැපත්වෙමින් තිබිණ. රථ මාර්ගය ඉද්ද ගැසුවාක් මෙන් කෙලින් ඇත. සැතපුම් දෙක තුනක් දුර ඉතා හොඳින් පෙනෙයි. අප පාර මැද තිබුණු ටකරන් හෙවිල්ලූ කුඩා මුරගෙයක් වැනි ගොඩ නැගිල්ලක් පසුකරනු මට මතක ය. එක්වරම වාහනයේ වේගය අඩු කළ රියැදුරු **Oh I made a mistake** (මට වැරදීමක් වුණා) යනුවෙන් පවසා වාහනය ආපස්සට හරවා නැවත අර ටකරන් සෙවිලි කළ මුරගෙය පසුකරගෙන විත් වාහන නැවැත්විය හැකි කුඩා ස්ථානයක නවතා " අපි ඕමාන් බෝඩරයට ආවා " යයි පැවසී ය.

මම විඩියෝ කැමරාවද, බිරිඳ සාමාන්‍ය කැමරාවක් ද රැගෙන දියණියන් දෙදෙනා සමග වාහනයෙන් බැස්සෙමු. අර කිවූ මුරගෙයට එහායින් විශාල දැන්වීමක් වන් පුවරුවක **Welcome to Oman** (ඕමානයට පැමිණි ඔබ සාදරයෙන් පිළිගනිමු.) යන්න ලියා ඇත. මට එක්වරම රියැදුරු කියූ **මට වැරද්දක් වුණා** යන්න සිහියට නැගිණ. මේ තිබෙන ආකාරයට නම් අප වාහනය **UAE / Oman** බෝඩරය පැන ඕමාන් පැත්තට ගොස් නැවත හරවාගෙන අවුත් **UAE** / ඩුබායි ප්‍රදේශයේ නැවැත්වීම කර ඇත. පාර මැද ඇත්තේ ඕමාන් ආගමන විගමන කුටිය විය යුතුය. එහෙත් එහි කිසිම නිලධාරියෙක් පෙනෙන්නට නැත. පෝරණුවක සිටිනු මෙන් ගිනි රස්නය දැනෙන එම දහවල මගේ කොඳු නාරටිය දිගේ සීතලක් ගලා යනවා මෙන් දැනිණ. එහෙත් කමක් නැත. පින්තූර ගත යුතු ය.

විඩියෝ කැමරාව අටවාගත් මම **welcome to Oman** යන පුවරුවේ සිට දර්ශන ගතකිරීම ඇරඹුවෙමි. මා බිරිඳ ඇගේ කැමරාවෙන් පින්තූර ගන්නවා දුටුවෙමි. දරුවෝ දෙදෙන කාන්තාරයේ වැල්ලේ සෙල්ලම් කරමින් සිටියහ.

එක්වරම කෑගසමින් මහ හඬක් නගමින් අරාබි ජාතිකයෙක් අර මුරකුටියේ සිට එළියට පැන්නේ ය. එවිට මා සිටියේ කුඩා දියණියන් දෙදෙනා විඩියෝ ගතකරමිනි. බියපත් වූ ඔවුන් දිව යනවා එහි සටහන් වුණි. දුවගෙන අප වෙත ආ නිලධාරියා එක්වරම මගේ කැමරාව ද, බිරිඳගේ කැමරාවද උදුරාගත්තේය. මම ඔහුගේ අතේ එල්ලී පිංසෙණ්ඩු වුනෙමි. ඔහුට ඉංග්‍රීසි කතාකළ නොහැක. වහා රියැදුරු වෙතට හැරී **අපි පින්තූර ගත්තේ නැතැයි කියන්නට** යයි කීවෙමි. එහෙත් අරාබි නිලධාරියා කිසිම වගවිභාගයක් නැතිව බිරිඳගේ කැමරාවේ රෝල ගැලවීමට උත්සාහ කරයි. ඒ අතරේ මගේ වීඩියෝ කැමරාව යළිත් මා අතට දී මවිසින් විඩියෝ ගත කරන ලද දේ පෙන්වීමට කියයි. මම කැමරාව ගෙන රීවයින්ඩ් කළෙමි. එවිට එහි දර්ශණය වූයේ වෙළඳපොලක ගන්නා ලද පින්තූරය. ඒ අතර රියැදුරට කතා කළ මම මේ කැමරා දෙක සහ පටි අපට දීමට කීයක් අවශ්‍යදැයි අසන ලෙස ඉල්ලා සිටියෙමි.

මා උත්සාහ කළේ නිලධාරියාට අල්ලසක් දී කැමරා සහ පටි නැවත ලබාගැනීමට ය. ඒ පටලවල මගේ දෙමව්පියන්ගේ පින්තූර තිබෙන බව ද කියන්නට යයි කීවෙමි. රියැදුරා නිලධාරියාට යමක් පැවසීය. එක්වරම ඔහු කැමරා අප අතට දී පලයල්ලා වැනි යමක් පවසා අප තල්ලුකර දැමීය. අපි වහා වාහනයට ගොඩවී ගමන ආරම්භ කළෙමු. Are you upset sir? රියැදුරා මගේ මුහුණ බලමින් ඇසීය. " නෑ..... නෑ..... අපි හෝටලේට යමු......" මම කීවෙමි.

ලන්ඩනයට පැමිණි පසු එම සිද්ධිය මගේ අරාබි මිතුරෙකුට පැවසුවෙමි. ඔළුවට අතගසාගත් ඔහු කීවේ අප ඩුබායි-ඕමාන් මායිම වීසා නොමැතිව පැනගොස් ඇති බවත්, එසේ යන වාහන වලට බොහෝ විට වෙඩිතබන අවස්ථා ඇති බවත් ය.

" උඹ නම් හරි ගොනෙක් " යනුවෙන් පැවසූ අරාබි මිතුරා මෙසේද කීවේය. " උඹ දන්නවද ඔය නිලධාරීන් ඔලුවෙ කැක්කුමක් හැදුනත් බෙහෙත් ගන්නෙ ලන්ඩන් වල රෝහල් වලින්. ඒ තරම් පොහොසත්. උඹට පුළුවන්ද බං උන්ට පගාව දෙන්න යන්න..... ? "

එදායින් එදා පගාව දීමේ හොඳ පුරුද්ද මම අත්හැර දැමුවෙමි.

**නීතිඥ අනුර හෑගොඩ**



# තම රටේම ජනතාවට වහ කවන ලංකාවෙ ආසනික් සමාගම්

## අවංක රේගු නිලධාරීන් පිරිසක් නිසා සිදුවන්නට ගිය මහා විනාශයක් නවතී




අපි කවුරුත් නිතර ප්‍රවෘත්ති වලට අහනවා රජරට හෙවත් අනුරාධපුර, පොළොන්නරුව, කන්තලේ පැත්තෙ ජීවත්වන මිනිස්සු හරියට ලෙඩ වෙනවා කියලා. ඒ පැත්තෙ හුඟ දෙනෙකුට තියෙන්නෙ වකුගඩු රෝග. අපට පාසැලේදි ස්වස්ථතා පාඩමට කියලා දීලා තියෙනවා වකුගඩු රෝග හැදෙන්න මූලික හේතුව ගන්නා ආහාර සහ බොන ජලය බව. ඒ රජරට හොඳ වැව් ආදි රජකාලෙ ඉඳලා තියෙනවා. එහේ ළිං පොකුණු තියනවා. කොළඹ සහ ඒ අවට බෙදන ලබුගම ක්ලෝරීන් දාපු කිවුල් රහ වතුර වගේ නෙවෙයි. (මට මතකයි මෑතක කොලොන්නාවෙ ගිය වෙලාවෙ මම එහේ යාළුවෙකුගෙ ගෙදරින් තේ එකක් බිව්වා තනිකරම මලකඩ රහයි)

කොහොම නමුත් එහෙම හොඳ වතුර තිබුණු රජ රට මිනිස්සු මෑත කාලෙ හරියට වකුගඩු රෝග හැදිලා මැරෙන්න පටන්ගත්තා. පස්සෙ පස්සෙ තමයි හොයන්න පටන්ගත්තෙ. ඒකට හේතුව. රජරට රෝහල්වල වෛද්‍යවරුන්ගෙ පර්යේෂණ වලිනුත් නිගමනය වුණේ ඒ මිනිස්සු දිනපතා බොන වතුර සහ කන ආහාර ශරීරයට අහිතකර බව. ඉතින් ඒ එක්කම කල්පනා කළොත් ඒ පැතිවල මිනිස්සු වෙන මොනවා කන්නද? බොන්නද? කන්නෙ එහේ වැවෙන දේවල්. බොන්නෙ ඒ පැත්තෙ වතුර.

වකුගඩු රෝගයෙන් රජරට පළාත්වල මේ මෑත කාලයේ මියගිය සංඛ්‍යාව 20,000 කට වැඩියි. තව 20,000ක් පමණ ඉදිරි කාලයෙ මිය යාමට නියමිතව සිටින බව විශේෂඥ වෛද්‍ය මහාචාර්‍ය ප්‍රියානි පරණගම මහත්මිය කියනවා. මේ දැක්වූ සංඛ්‍යා ලේඛනය ඇයද ඇතුළු වෛද්‍ය විශේෂඥවරුන් කමිටුවකගෙ සායාගැනීම්. මේ අය තමයි හරියටම දැනගත්තෙ රජරට මිනිස්සුන්ගෙ රෝගී තත්වයේ සුලමුල.

මේ වකුගඩු ප්‍රශ්නයට හේතුභූත වූ මුල කුමක්දැයි තවත් දුරට සොයලා බලද්දි වෛද්‍යවරුන්ට දැනුණු දේ මෙයයි.

රජරට මිනිස්සුන්ගෙන් බහුතරය ගොවියො. ඒ මිනිස්සු ගොවිතැන් සඳහා යොදන කෘෂි රසායනික පෝරවල දරුණු විශ බෙහෙත් අඩංගුයි. කෘමි සතුන් වඳකරන්න ගහන විස බෙහෙත් පොළවට වැටුණම ඒවා වැස්සට දියවෙලා ගඟට, වැවට, ඔයට, ළිං වලට යනවා. ඒවා බිව්වම, නෑවම ඇඟට විස එකතු වෙනවා. වකුගඩු නරක් වෙනවා. ඒ විස කෘෂි රසායනික පෝර දාලා හදන එළවළු හා වී හාල් බත් කෑවමත් ඒ තත්වෙම තමයි. මේ මෑතක ඒ පෝර සහ කෘමි නාශකවලට **ආසනික්** කියන කවුරුත් දන්නා උග්‍ර වස එකතු කරලා තියෙනවා. ඒ ආසනික් හුඟක් රටවල පාවිච්චිය තහනම් කරපු වස වර්ගයක්. ඒත් ලංකාවට ගෙන්වන පෝර හා කෘමිනාශක වල ඒවා බෙහෙවින් අඩංගුයි. දැන් පේන විදියට ලංකාවෙ මිනිස්සු කන ආහාර වල හරියට ආසනික් අඩංගු බව පේනවා. මේවා මේතාක් කල් හෙළි නොවී තිබුණේ මේ විස බෙහෙත් ලංකාවට ගෙන්වන්නෙ මල්ටි මිලියන් කොම්පැනි ඒ රහස වසන්කරගෙන වැඩකරපු නිසයි. මේ කොම්පැනිකාරයින්ට කවුරු හිටියත් මැරුණත් ප්‍රශ්නයක් නැහැ උන් පිටරටින් ගේන දේවල් විකුණගන්න පුළුවන් නම්.

දැනට සතියකට පෙර එනම් ජුනි 2 දා ශ්‍රීලංකා රේගුව ශ්‍රීලංකාවේ ප්‍රධාන සහ සුප්‍රකට සමාගම් හතරක් ලංකාවට ගෙන්වූ කෘෂිරසායනික විශාල තොගයක් රේගුවේදි නවත්වාගත්තා පරීක්ෂණය සඳහා. ඒ ගෙන්වූ සමාගම්වල මැනේජර්ලා කිව්වෙ " අයියෝ ඕවයෙ පරීක්ෂාකරන්න බලන්න දෙයක් නැහැ....වෙනද ගේන ඒවම තමයි....ඉක්මනට අපිට ඕවා ක්ලියර්කරලා දෙන්න.. අපිට යන්න ඕන...හරියට වැඩ තියනවා"

එහෙත් රේගු නිලධරීන් ඒ කිසි වචනයකට ඇහුම් කන් නොදී තම පරීක්ෂණ පැවැත්තුවා. එතකොට අහුවුණා ඒ ගෙනාපු රසායනික ද්‍රව්‍ය වල ආසනික් බහුලව අඩංගුවෙලා තියන බව. ඒ නිලධාරි වහාම ඒ බව ජනාධිපතිවරයාට දැනුම් දුන්නා. ජනාධිපතිවරයා කිව්වේ " ඔය එකක්වත් ගෙනියන්න දෙන්න එපා. ඕව සේරම තියාගන්න... කිසිදේකට බයවෙන්න එපා.... ඔය ගොල්ල කරන රාජකාරිය හරියට කරන්න...."

ඒ ආසනික් වස ගෙන්නපු සමාගම් හතර තමයි, හේලීස්, ඇග්රෝ, සී අයිසී සහ මහාරාජා කියන මහාපරිමාණ බිස්නස් ආයතන. මෙයිනුත් මහාරාජා ගෙන්වපු පලිබෝධ නාශක වල තමයි වැඩියෙන්ම ආසනික් වස අඩංගු වෙලා තිබුණේ.

ඉතා අවංක ඒ වගේම රටට ආදරේ ඇති ඒ රේගු නිලධාරී මහත්වරු නිසා ලොකු විනාසයක් මගහරවා ගන්න හැකි වුණා. ඒ අය නොහිටියා නම් ලංකාවෙ තව දහස්ගණනක් වස කැවිලා මැරෙනවා. ඒ සමහර නිලධාරීන්ට මරණීය තර්ජන එල්ලවී ඇති බව ද දැන ගන්නට ලැබෙනවා. නමුත් එක දෙයක් පැහැදිලියි. මීට පස්සෙ ආසනික් ලංකාවට ගේන්න ලැබෙන්නෙ නැහැ.

**♦ වෙලේගෙදර රාළ London**